## රජයේ නිවේදනයකි
## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත
## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 අගෝස්තු මස 01 දින සිට ආරම්භ වන මාස 03 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.05.07 දිනැති අංක 2174/7 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත අදාල නියමය අගෝස්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ**
**මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය**

2020 ජූලි මස 31 වන දින
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදීය.

උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
| --- | --- | --- | --- | --- |
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. වි. ශීර්ෂය | සං. වි. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1 | 03.05 | 0305.54.10 | හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු. 1.00 |
| 2 | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි. ග්‍රෑමයට රු. 52.00 |
| 3 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු. 50.00 |
| 4 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 5 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 6 | 08.10 | 0810.50 | කිවිප්‍රුට් | කි. ග්‍රෑමයට රු. 175.00 |
| 7 | | 0810.90.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු.200.00 |